අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2021

මතුගම අධ්‍යාපන කලාපය

**පුරවැසි අධ්‍යාපනය**

කාලය පැය 01

සැලකිය යුතුයි:-

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුල (X) ලකුණ යොදන්න.
  (විභාගයේදී පිළිතුරු ලිවීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

(01) ග්‍රීසියේ පෞර රාජ්‍යයේ පාලන කටයුතු වලට මහභාගී වූයේ,
(1) ප්‍රාදේශීය පාලකයින් ය. (2) තරුණ තරුණියන් ය.
(3) වයස අවුරුදු 30 ට වැඩි පිරිමින් ය. (4) වැඩිහිටි කාන්තාවන් ය.

(02) ක්‍රි.ව. 5 වන සියවසේ සිට 15 වන සියවස දක්වා යුරෝපයේ පැවති පාලන ක්‍රමයක් වන්නේ
(1) සමාජවාදී පාලනයකි (2) ධනවාදී පාලනයකි
(3) ලිබරල්වාදී පාලනයකි (4) වැඩවසම් පාලනයකි

(03) පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමට බලපෑ විප්ලවයක
(1) 1688 ඉංග්‍රීසි විප්ලවය (2) 1789 ප්‍රංශ විප්ලවය
(3) 1917 රුසියන් විප්ලවය (4) 1776 ඇමරිකන් විප්ලවය

(04) දිගාමඩුල්ල මැතිවරණ දිස්ත්‍රික්කය අයත් පළාත
(1) දකුණු පළාත (2) ඌව පළාත
(3) නැගෙනහිර පළාත (4) මධ්‍යම පළාත

(05) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතුවකි,
(1) වැඩවසම් ක්‍රමයේ නැගී සිටීම (2) විද්‍යාත්මක දැනුම වර්ධනය නොවීම
(3) රෝමානු මුස්ලිම් ආගම් බිහිවීම (4) පුනරුදය

(06) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමය හා අදාළ ප්‍රකාශය වන්නේ,
(1) මහජනතාව විසින් පාලකයන් උදෙසා ගෙන යනු ලබන පාලන ක්‍රමයකි.
(2) සියළු පුරවැසියන්ට අයිතිවාසිකම් සහතික කරන ආණ්ඩුක්‍රමයකි.
(3) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවක් බලෙන් පෙරලා දැමීමට මහජනතාවට හැකිය.
(4) ග්‍රීක පෞර රාජ්‍යයන් තුළ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වීම.

(07) රාජ්‍යයක ප්‍රධාන අංග හා අදාළ ප්‍රකාශය වන්නේ,
(1) ව්‍යවස්ථාදායකය, ජනගහනය, විධායකය, ස්වාධිපත්‍යය.
(2) භූමිය, විධායකය, අධිකරණය, ජනගහනය.
(3) ව්‍යවස්ථාදායකය, භූමිය, ජනගහනය, ආණ්ඩුව
(4) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍යය

(08) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය හා අදාළ මූලික ලක්ෂණයක් වන්නේ,

(1) ව්‍යවස්ථාදායකය හා විධායකය මැතිවරණ දෙකක් මගින් තේරී පත්වීම

(2) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වීම

(3) සාමූහික වගකීම යන සිද්ධාන්තයෙන් බැහැරව සිටීම ය.

(4) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සම්බන්ධතාවක් නොපැවතීම ය.

(09) ජනාධිපති ආණ්ඩුක්‍රමය හා අදාළ මූලික ලක්ෂණයක් වන්නේ,

(1) ව්‍යවස්ථාදායකයට වගකීම හා අස්ථාවර ක්‍රමයක් වීම

(2) ව්‍යවස්ථාදායකය හා විධායකය අතර දුරස්ථ සම්බන්ධතාවක් පැවතීම හා ස්ථාවරත්වය යි.

(3) ජනාධිපති ව්‍යවස්ථාදායකයෙන් තෝරාගැනීම හා ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සමීප සම්බන්ධතාවයයි.

(4) ජනාධිපති නාමික වීම හා සෘජු මහජන ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමයි.

ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රම වල අඩංගු මූලික ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. ඒ අනුසාරයෙන් අංක 10 සහ 11 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A- බලය සංකේන්ද්‍රගත වීම.

B- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් බලය ප්‍රාන්තවලට බෙදා පැවතීම.

C- උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පැවතීම.

D- බහු සංස්කෘතික සමාජයට වඩාත් ගැලපීම.

E- අධිකරණ ප්‍රතිනිරීක්ෂණ බලය පහළ උසාවි වලට පවරා තිබීම.

F- ඒකීය පුරවැසිභාවය

G- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීම සඳහා සංකීර්ණ පටිපාටි අවශ්‍ය නොවීම.

(10) ඒකීය ආණ්ඩුක්‍රමයකට වඩාත් සුදුසු කාණ්ඩය තෝරාන්න.

(1) ABC (2) ACD (3) AEG (4) CDE

(11) සන්ධීය ආණ්ඩුක්‍රමයකට වඩාත් සුදුසු කාණ්ඩය තෝරාන්න.

(1) ABC (2) BCD (3) CEF (4) DFG

(12) ක්‍රි.ව. 1865 දී මහා නගර සභා ආඥා පනත යටතේ පිහිටුවනු ලැබූ මහ නගර සභාවකි.

(1) යාපනය (2) ගාල්ල (3) කොළඹ (4) මහනුවර

(13) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මැතිවරණ දිස්ත්‍රික්ක ගණන,

(1) 23 කි (2) 22 කි (3) 24 කි (4) 25 කි

(14) පළාත් සභාවක නිල කාලය,

(1) අවුරුදු 4 කි (2) අවුරුදු 3 කි (3) අවුරුදු 6 කි (4) අවුරුදු 5 කි

(15) ඇමරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනය කළ වර්ෂය වන්නේ,

(1) ක්‍රි.ව. 1887 (2) ක්‍රි.ව. 1789 (3) ක්‍රි.ව. 1787 (4) ක්‍රි.ව. 1790

(16) යහපාලනයේ ගුණාංග වන්නේ,
(1) මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම (2) අයිතිවාසිකම් සුරැකීම හා තහවුරු කිරීම
(3) විනිවිදභාවයකින් යුතුව කටයුතු කිරීම (4) රාජ්‍ය සේවය දේශපාලනීකරණය කිරීම

(17) "වෙනස්කම් තුළින් එකමුතු බව" යන්න තේමාව කරගත් රටකි,
(1) සිංගප්පූරුව (2) ජපානය
(3) ඉන්දියාව (4) තායිලන්තය

(18) ප්‍රාග්ධනය සඳහා කරනු ලබන ගෙවීම වන්නේ,
(1) බදු (2) වැටුප් (3) පොළිය (4) ලාභය

(19) ධනවාදී අර්ථ ක්‍රමයක ප්‍රධාන ලක්ෂණය වන්නේ,
(1) දේපල අයිතිය රජය සතු වීම
(2) ලාභය අරමුණු කරගැනීම
(3) පොදු යහපත උදෙසා කටයුතු කිරීම
(4) මධ්‍ය ගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙයවීම

(20) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට ඇති වූ සෘණාත්මක බලපෑමක් වන්නේ,
(1) ආර්ථික විවිධාංගීකරණය වීම.
(2) කාර්මික හා සේවා අංශවල ප්‍රගතිය ඇති වීම.
(3) විවිධ කලාපීය සංවිධාන බිහිවීම.
(4) බුද්ධිගලනය වේගවත් වීම.

(21) ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයෙන් සම්මත වූ පනත් කෙටුම්පතක් නීතියක් බවට පත්වීම සඳහා අත්සන් කළ යුතු වන්නේ,
(1) ජනාධිපතිවරයාය (2) කථානායකවරයාය
(3) ඇගමැතිවරයාය (4) පාර්ලිමේන්තු මහලේකම්වරයාය

(22) ශ්‍රී ලංකාවේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පිහිටුවන ලද්දේ,
(1) ශ්‍රේෂ්ඨාධිකරණය (2) අභියාචනාධිකරණය
(3) පළාත්බද මහාධිකරණය (4) මහේස්ත්‍රාත් අධිකරණය

(23) 1978 ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් නව අංගයක් වන්නේ,
(1) නාමික විධායකය (2) ජනවර්ගික නියෝජන ක්‍රමය
(3) ඔම්බුඩ්ස්මන් තනතුර (4) ශ්‍රේෂ්ඨාධිකරණය

(24) මහා මැතිවරණයකදී ඡන්ද කොට්ඨාසයක් ලෙස සලකනු ලබන්නේ,
(1) පළාතය (2) දිස්ත්‍රික්කය
(3) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය (4) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

(25) පරිසරය හා සම්බන්ධ පුරවැසි යුතුකමක් වන්නේ,
(1) අසීමිතව සම්පත් භාවිතා කිරීම
(2) තම අභිමතය පරිදි සම්පත් වලින් උපරිම ප්‍රයෝජනයක් ගැනීම
(3) නව සම්පත් ගවේෂණය
(4) පරිසර සම්පත් අරපිරිමැස්ම

(26) අපරාධ නීතියට අනුව දඬුවම් ලැබිය යුතු වරදක් වන්නේ,
(1) පොදු දේපල හානි කිරීමය
(2) ජාත්‍යන්තර ගිවිසුම් කඩ කිරීමය
(3) ස්වාමි පුරුෂයාගේ අවසරය නොමැතිව දේපල තැගිදීමය
(4) අධිකරණ නියෝගයකින් පුද්ගලයෙකු එල්ලා මැරීමය

(27) ශ්‍රේෂ්ඨාධිකරණය සතු අධිකරණ බලයක් නොවන්නේ,
(1) පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
(2) ජනාධිපතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
(3) ජනමතවිචාරණ පෙත්සම් විභාග කිරීමේ බලය
(4) උපදේශන අධිකරණ බලය

(28) ශ්‍රී ලංකාවේ අනුරාධපුර යුගයේ අගභාගය වන විට තිබූ පාලන ඒකකය වන්නේ,
(1) රජරට, දක්ඛින දේශය, දොලොස් දහස්රට
(2) රජරට, රුහුණු රට, මලය රට
(3) දිසාව, කෝරල, පත්තු
(4) දොළොස් දහස්රට, අට දහස්රට, මලය රට

(29) 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් ඇතුළත් කර ඇති වගන්ති වන්නේ,
(1) 10 සිට 14 දක්වා (2) 10 සිට 16 දක්වා
(3) 10 සිට 18 දක්වා (4) 10 සිට 12 දක්වා

(30) "කෙනෙකුට සැරයටියක් වනමින් පාරේ ගමන් කළ හැකි වුවත් එම නිදහස අනෙකාගේ නාසය ළඟින් කෙළවර විය යුතුය." මෙම ප්‍රකාශය ඉදිරිපත් කෙළ්,
(1) ගානර් (2) රූසෝ ය (3) ලැස්ති (4) ඩානේටි ය

(31) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම විශේෂ අරමුණු 4 ක් පදනම් කරගෙන සිදුවේ. එම අරමුණු නිවැරදිව දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) පැවැත්ම, ආරක්ෂාව, සංවර්ධනය, සහභාගීත්වය
(2) අධ්‍යාපනය, සෞඛ්‍යය, පැවැත්ම, ආරක්ෂාව
(3) පැවැත්ම, ආරක්ෂාව, සංවර්ධනය, අධ්‍යාපනය
(4) සෞඛ්‍ය, ආරක්ෂාව, අධ්‍යාපනය, ආගම ඇදහීම

(32) ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ පුරවැසියෙකු ලෙස සැලකෙන කඩඉම් වයස වන්නේ,
(1) 50-55 අතර ය (2) 55-60 අතර ය
(3) 60-65 අතර ය (4) 65-70 අතර ය

(33) සම්පත් ඵලදායිතාව දියුණු කිරීමට යොදාගන්නා ලෝකයේ භාවිතා වන උපාය මාර්ගයක් නොවන්නේ,
(1) හරිත ඵලදායිතාව (2) පූර්ණ ගුණාත්මක කළමණාකරණය
(3) වැරදි ශූන්‍ය කිරීම (4) ඵලදායිතා සංකල්ප අවභාවිතය

(34) තිරසාර සංවර්ධනයේදී වැදගත් වන 3R සංකල්පය යටතට නොගැනෙන්නේ,
(1) වැඩි කිරීම (2) නැවත භාවිතය (3) අවම කිරීම (4) ප්‍රතිචක්‍රීකරණය

(35) ජාත්‍යන්තර සම්බන්ධතා පැවැත්වීම තුළින් ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණක් නොවන්නේ,

(1) තම රාජයයට තනිව සපුරා ගත නොහැකි දේ සපුරා ගැනීම
(2) දේශපාලන, ආර්ථික, සංස්කෘතික, සමාජීය ආදී ක්ෂේත්‍ර
(3) ප්‍රභල රාජ්‍ය වලින් ඇති කරන බලපෑම් වලින් ආරක්ෂා වීම
(4) ආරක්ෂණවාදී ප්‍රතිපත්ති වලින් ඇතිවන බාධා මඟ හරවා ගැනීම

(36) සාර්ක් සංවිධානය ආරම්භ කරන අවස්ථාවේ පටන්ම සාමාජිකත්වය ලබාගෙන සිටි රටක් නොවන්නේ,

(1) පාකිස්ථානය (2) බංගලාදේශය (3) භූතානය (4) ඇෆ්ගනිස්ථානය

(37) බිම්ස්ටෙක් (BIMSTC) සංවිධානයට 2005 වර්ෂයේදී එකතු වූ නව සාමාජික රාජ්‍යයන් දෙක වන්නේ,

(1) නේපාලය හා ඇෆ්ගනිස්ථානය (2) භූතානය හා පාකිස්ථානය
(3) පාකිස්ථානය හා ඇෆ්ගනිස්ථානය (4) නේපාලය හා භූතානය

(38) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර සාමාජිකයන් 5 දෙනා අතරට අයත් නොවන්නේ,

(1) ඇමරිකා එක්සත් ජනපදය (2) බ්‍රිතානය
(3) ජපානය (4) ප්‍රංශය

(39) පහත "අ" තීරුවේ ගැටුම් ඇතිවන මූල ද "ආ" තීරුවේ ඒවාට නිදසුන් ද දක්වේ.,

| "අ" | "ආ" |
|---|---|
| 1. වාර්ගිකත්වය | A- කුරුස යුද්ධය |
| 2. දේශපාලනය | B- සෝමාලියාව, ඉතියෝපියා ගැටුම් |
| 3. සමාජ ආර්ථික තත්ත්වය | C- ඊශ්‍රායලය හා පලස්තීනය අතර ගැටුම් |
| 4. ආගමික මතවාද | D- රුවන්ඩාවේ ටුට්සිවරු හා හුටුවරු අතර ගැටුම් |

"අ" තීරුවේ අනුපිළිවෙලට "ආ" තීරුවේ නිදසුන් ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දක්වෙන වරණය තෝරන්න.

(1) C,AB,D (2) D,A,B,C (3) D,C,B,A (4) D,B,A,C

(40) පහත "අ" තීරුවේ ගැටුම් නිරාකරණ ක්‍රම සහ "ආ" තීරුවේ ඒවාට අදාල ලක්ෂණ ද දක්වේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. සහමන්ත්‍රණ කේවල් කිරීම | A- ප්‍රතිවරුද්ධ පාර්ශවය අතර සංවාදයක් ඇති කිරීම |
| 2. සාකච්ඡා කිරීම | B- හොඳ සවන්දෙන්නෙකු වීම |
| 3. මැදිහත්කරණය | C- සාකච්ඡාවෙන් විසඳුමකට යොමු වීම |
| 4. සමථකරණය | D- සේව්‍ය සේවක දෙපාර්ශවයකින් යුක්ත වීම. |

"අ" තීරුවේ අනුපිළිවෙලට "ආ" තීරුවේ ලක්ෂණ ගැලපූ විට නිවැරදි අනුපිළිවෙල දක්වෙන වරණය තෝරන්න.

(1) D,C,B,A (2) C,B,D,A (3) B,A,C,D (4) A,B,C,D

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2021

මතුගම අධ්‍යාපන කලාපය

පුරවැසි අධ්‍යාපනය

කාලය පැය 02

සැලකිය යුතුයි:-

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (i) කොළඹ සහ මහනුවර යන මහ නගර සභා ස්ථාපිත කරන ලද වර්ෂ දෙක පිළිවෙලින් ලියන්න.

(ii) 1980 දී දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රියාත්මක කරමින් අහෝසි කරන ලද ආයතන දෙක නම් කරන්න.

(iii) "සංස්කෘතිය" සම්බන්ධයෙන් නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකුලේ නම් ලියන්න.

(iv) සංකීර්ණ බහු සංස්කෘතියක් පවතින රටවල් දෙකක් ලියන්න.

(v) වෙළදාම දේශීය හා විදේශීය වශයෙන්ද සිදු වේ. වෙළදාම බෙදිය හැකි ප්‍රධාන කොටස් දෙක ලියන්න.

(vi) දකුණු ආසියානු වරණාත්මක වෙළඳ ගිවිසුමට (SAPTA) අයත් රටවල් දෙකක් ලියන්න

(vii) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව කොටස් දෙකකි. එම කොටස් දෙක සඳහන් කරන්න.

(viii) සී.එෆ්. ස්ට්‍රෝන්ග් ට අනුව ආණ්ඩුක්‍රමයක පවතින ප්‍රධාන ලක්ෂණ දෙක ලියන්න.

(ix) ආබාධ සහිත පුද්ගලයින්ගේ සහ ආදිවාසී හා ගෝත්‍රික ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ඇති කළ සම්මුති දෙක වර්ෂ දෙක ලියන්න.

(x) ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයාගේ බලය සංවර්ණය කරන ලද ව්‍යවස්ථා සංශෝධන දෙක ලියන්න.

(02) (i) පරමාධිපත්‍ය බලයට අයත් ක්ෂේත්‍ර දෙකක් නම් කරන්න. (ල. 02)

(ii) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වලට පැවරී ඇති පොදු කාර්යයන් තුන ලියන්න. (ල. 03)

(iii) ආණ්ඩුව කෙරෙහි පුරවැසියාගෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් තුනක් දක්වා එයින් දෙකක් විස්තර කරන්න. (ල. 05)

(03) (i) ජෝන් ගැල්ටුංගේ ගැටුම් ත්‍රිකෝණයට අනුව ගැටුමට හේතු වන කරුණු දෙකක් ලියන්න. (ල. 02)

(ii) අන්තර්ජාතික ගැටුම් ඇති වීම කෙරෙහි බලපාන හේතු තුනක් ලියන්න. (ල. 03)

(iii) ගැටුම් සාමකාමීව විසදා ගැනීමෙන් ඇති වන වාසි තුනක් දක්වා ඉන් දෙකක් විස්තර කරන්න. (ල. 05)

(04) (i) ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණ දෙක ලියන්න. (ල. 02)

(ii) අභියාචනාධිකරණය සතු අධිකරණ බලතල තුනක් ලියන්න. (ල. 03)

(iii) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දක්නට ලැබෙන ලක්ෂන තුනක් ලියා දෙකක් පැහැදිලි කරන්න. (ල. 05)

(05) (i) මානව අයිතිවාසිකම් හා මූලික අයිතිවාසිකම් අතර වෙනස පැහැදිලි කරන්න.(ල. 02)

(ii) මානව අයිතිවාසිකම් සම්බන්ධ පහත දැක්වෙන සුවිශේෂී අවස්ථා වලට අදාළ වර්ෂ වරහන් තුළින් තෝරා ලියන්න. (1948, 1989, 1993, 2001)

A- ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම.
B- එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මගින් ළමා අයිතිවාසිකම් සම්මුතිය සම්මත කර ගැනීම.
C- එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (ල. 03)

(iii) A- මූලික අයිවාසිකම් කඩවූ විට පිහිට පැතිය හැකි ආයතන තුනක් ලියන්න.(ල. 03)
B- අයිතිවාසිකම් හා බැඳුණු පුරවැසි යුතුකම් ප්‍රධාන කොටස් දෙකකි. එම යුතුකම් දෙක ලියන්න. (ල. 02)

(06) (i) සමාජ පරිසරයේ භෞතික සැකැස්ම තුළට ඇතුළත් වන අංශ දෙකක් ලියන්න.(ල. 02)

(ii) ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල තුනක් ලියන්න. (ල. 03)

(iii) පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවා තුනක් සඳහන් කර එයින් දෙකක් විස්තර කරන්න. (ල. 05)

(07) (i) දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ ඇති වූ ප්‍රධාන බල කඳවුරු දෙක සඳහන් කරන්න. (ල. 02)

(ii) A- යුධමය අරමුණු පෙරදැරි කොටගත් කලාපීය සංවිධාන දෙකක් ලියන්න.(ල. 02)
B- ආර්ථික සහයෝගීතාව අරමුණු කොටගත් කලාපීය සංවිධානයක් ලියන්න.(ල. 01)

(iii) බලවත් රාජ්‍ය විසින් බලයෙන් අඩු රාජ්‍ය වෙත බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර තුනක් සඳහන් කර එම ක්ෂේත්‍ර දෙකක් ශ්‍රී ලංකාව වෙත එල්ල කරන බලපෑම කෙටියෙන් විස්තර කරන්න. (ල. 05)

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2021

මතුගම අධ්‍යාපන කලාපය

පුරවැසි අධ්‍යාපනය

පිළිතුරු පත්‍රය

| | | | |
|---|---|---|---|
| 1 | 3 | 21 | 2 |
| 2 | 4 | 22 | 3 |
| 3 | 1 | 23 | 3 |
| 4 | 3 | 24 | 2 |
| 5 | 4 | 25 | 4 |
| 6 | 2 | 26 | 1 |
| 7 | 4 | 27 | 1 |
| 8 | 2 | 28 | 2 |
| 9 | 4 | 29 | 1 |
| 10 | 2 | 30 | 3 |
| 11 | 2 | 31 | 1 |
| 12 | 3 | 32 | 2 |
| 13 | 2 | 33 | 4 |
| 14 | 3 | 34 | 1 |
| 15 | 2 | 35 | 2 |
| 16 | 4 | 36 | 4 |
| 17 | 1 | 37 | 3 |
| 18 | 3 | 38 | 3 |
| 19 | 2 | 39 | 2 |
| 20 | 4 | 40 | 1 |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය 2021

මතුගම අධ්‍යාපන කලාපය

පුරවැසි අධ්‍යාපනය

පිළිතුරු පත්‍රය

(01) (i) 1965 සහ 1966

(ii) ගම්සභා,
සුළු නගර සභා

(iii) ටී.බී. ටයිලර්
චාර්ලිස් ඒ. එල්වුඩ්
ඒ.ටී. හීලර්

(iv) ඉන්දියාව
ඇමරිකා එක්සත් ජනපදය

(v) තොග වෙළදාම
සිල්ලර වෙළදාම

(vi) ශ්‍රී ලංකාව
ඉන්දියාව
බංගලාදේශය
පකිස්ථානය
භූතානය
නේපාලය
මාලදිවයින

(vii) දේශීය නීතිය
අන්තර් ජාතික නීතිය

(viii) මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතරභාවය
අතිරේක ස්වාධිපති ආයතන ආණ්ඩුක්‍රමය තුළ නොමැති වීම

(ix) ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබද එක්සත් ජාතීන්ගේ සම්මුතිය (2006)
ආදිවාසී සහ ගෝත්‍රික ජනතාව පිළිබද සම්මුතිය (1989)

(x) 17 සංශෝධනය
19 සංශෝධනය

(02) (i) පරමාධිපත්‍ය බලයට අයත් ක්ෂේත්‍ර
- පාලන බලතල
- මූලික අයිතිවාසිකම්
- ඡන්ද බලය

(ii) පළාත් පාලන ආයතන වලට පැවරී ඇති පොදු කාර්යයන්
- පොදු මංමාවත්
- මහජන සෞඛ්‍යය
- පොදු උපයෝගීතා සේවා

(iii) ආණ්ඩුව කෙරෙහි පුරවැසියාගෙන් ඉටුවිය යුතු වගකීම් හා යුතුකම්

1. ජාතික ආරක්ෂාව පවත්වාගෙන යාමට සහාය වීම.
2. සමාජ සංර්ධනයට හා යහපාලනයට සහාය වීම.
3. පරිසර කළමණාකරණයට දායක වීම.

(03) (i) ජෝන් ගැල්ටුංගේ ගැටුම් ත්‍රිකෝණයට අනුව ගැටුමට හේතු වන කරුණු

- ආකල්ප
- සන්දර්භය
- චර්යාව

(ii) අන්තර්ජාතික ගැටුම් ඇති වීම කෙරෙහි බලපාන හේතු තුනක් ලියන්න.

- සම්පත්
- ආර්ථික ප්‍රතිලාභ
- බල ව්‍යාපාතිය

(iii) ගැටුම් සාමකාමීව විසදා ගැනීමෙන් ඇති වන වාසි

- ජීවිත හානි වැලැකීම
- සම්පත් දේපල හානි වැලකීම
- මූලික හා මානව අයිතීන් ආරක්ෂා වීම.
- මානසික ආතතිය අවම වීම.
- පුද්ගල මානසිකත්වය ඉහල යාම.
- ආත්ම ගෞරවය සුරැකීම
- සාමය හා ආරක්ෂාව සුරත්ෂිත වීම
- දේශපාලන ස්ථාවරත්වය
- ආර්ථික ස්ථාවරත්වය
- ජාතික ඒකාබද්ධතාව ඇති වීම
- රට සමෘද්ධිමත් වීම.

(04) (i) ශ්‍රී ලංකාවේ ඉහළම අධිකරණ

- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය

(ii) අභියාචනාධිකරණය සතු අධිකරණ බලතල

- මහාධිකරණ හා වෙනත් අධිකරණවලින් දෙනු ලබන නීත්දුවලට එරෙහි අභියාචනා විභාග කිරීමේ බලය.
- පාර්ලිමේන්තු මැතිවරණ පෙත්සම් විභාග කිරීමේ බලය
- විවිධ ආඥා නිකුත් කිරීමේ බලය.
- මුල් අවස්ථා අධිකරණයක වාර්තා විමර්ෂණය කිරීමේ හා පරික්ෂා කිරීමේ බලය.

(iii) නීතියේ ආධිපත්‍ය තහවුරු වී ඇති සමාජයක දක්නට ලැබෙන ලක්ෂන

- ස්වාධීන අධිකරණ පද්ධතියක් තිබීම.
- නීතිය පිළිබඳව සෑම පුරවැසියෙකුම අවබෝධයක් තිබීම.
- නීතිය නොදන සිටීම නිදහසට කාරණයක් ලෙස නොසැලකීම.
- සාධාරණව හා අප්‍රමාදව යුක්තිය පසිදලීම.
- පුද්ගලයන්ගේ තරාතිරම, රැකියාව, ධනය හෝ වෙනත් කරුණු පදනම් කරගෙන නීතිය ක්‍රියාත්මක නොවීම.
- නීතිය ඉදිරියේ සෑම දෙනාම සමාන පුද්ගලයන් සේ සැලකීම.
- විනිශ්චයකාරවරුන්ට තම තීන්දු ගැනීමේදී බලපෑම් සිදු නොවීම.

(05) (i) මානව අයිතිවාසිකම්

- මිනිසත් බව ලැබීම හේතු කොට ගෙන පුද්ගයෙකුට උපතින්ම ලැබෙන අයිතීන් මානව අයිවාසිකම් ලෙස හැඳින්විය හැකිය.

මූලික අයිතිවාසිකම්

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු වී ඇති අයිතිවාසිකම් මූලික අයිවාසිකම් වේ.

(ii)

A- ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කිරීම.- 1993
B- එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය මගින් ළමා අයිතිවාසිකම් සම්මුතිය සම්මත කර ගැනීම. - 1989
C- එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය - 1948

(iii) A- මූලික අයිවාසිකම් කඩවූ විට පිහිට පැතිය හැකි ආයතන

- ශ්‍රේෂ්ඨාධිකරණය
- මානව හිමිකම් කොමිසම
- ඔම්බුඩ්ස්මන්

B- අයිතිවාසිකම් හා බැඳුණු පුරවැසි යුතුකම්

- නීතිමය යුතුකම්
- සදාචාරාත්මක යුතුකම්

(06) (i) සමාජ පරිසරයේ භෞතික සැකැස්ම තුළට ඇතුළත් වන අංශ

- බහු වාර්ගික තත්ත්වය, ආගම්, කුල, උරුම, සිරිත් විරිත්, අයිතිවාසිකම්, යුතුකම්, වගකීම්, වගවීම්, නෛතික සම්ප්‍රදායන්

(ii) ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන ප්‍රතිඵල

- ජෛව පරිසර සමතුලිතතාව බිඳ වැටීම
- ආවේණික ශාක හා සත්ව ප්‍රජාවන් විනාශ වීම.
- ජෛව පද්ධතීන්ගේ ක්‍රියාකාරීත්වය බිඳ වැටීම.
- ආහාර දාම හා ආහාර ජාල දාම බිඳ වැටීම
- ආක්‍රමණශීලී ශාක හා සත්ව ප්‍රජා බිහිවීම.

(iii) පරිසරයෙන් මිනිසාට ලැබෙන සේවා

- ජීව උපකාරක සේවා
- ආර්ථික උපකාරක සේවා
- අපද්‍රව්‍ය අවශෝෂන සේවා

(07) (i) දෙවන ලෝක යුද්ධයෙන් පසු ලෝකයේ ඇති වූ ප්‍රධාන බල කඳවුරු දෙක

- ඇමෙරිකා එක්සත් ජනපදය ප්‍රමුඛ බටහිර බල කඳවුර
- සෝවියට් දේශය ප්‍රමුඛ නැගෙනහිර බල කඳවුර

(ii) A- යුධමය අරමුණු පෙරදැරි කොටගත් කලාපීය සංවිධාන දෙක
  - නේටෝ (NATO)
  - වෝර්සෝ (Warsaw)

B- ආර්ථික සහයෝගීතාව අරමුණු කොටගත් කලාපීය සංවිධාන
  - යුරෝපා ආර්ථික ප්‍රජාව
  - යුරෝපා හවුල
  - ලතින් ඇමෙරිකානු නිදහස් වෙළඳ සංගමය
  - ආසියන් සංවිධානය
  - සාක් සංවිධානය ආදිය

(iii) බලවත් රාජ්‍ය විසින් බලයෙන් අඩු රාජ්‍ය වෙත බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර

- අන්තර්ජාතික වෙළදාම
- ණය හා ආධාර දීම
- ආර්ථික සංවර්ධනය
- ආරක්ෂක ක්ෂේත්‍රය
- රැකියා ක්ෂේත්‍රය
- තාක්ෂණික ඥාණය